## සෙනසුරාදා

පළමුවන කියැවීම ප්‍රඥා 18: 14-16: 19: 6-9

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් ගත් පාඨයෙකි.

"රතු මුහුද බාධා විරහිත මාර්ගයක් විය. ඔවුහු බැටළු පැටවුන් මෙන් පැන පැන ගියහ."

සව් සත නිහඬ ව සාමයෙන් සිටිද්දී රාත්‍රියෙන් අඩක් විගස ගෙවී ගොස් තිබෙද්දී සගලොවින් රාජ සිහසුණෙන් සව් බලැති ඔබේ වචනය තෙම බැස වදාළ සේක. ඒ ධීර වීර සෙබලාණෝ විනාශයට නියම වූ දේශය මැදට වැඩිය සේක. එතුමාණෝ මුවහත් කඩුවක් මෙන් ඔබේ පැහැදිලි ආඥාව ක්‍රියාවේ යොදවමින් වැඩ සිටිය සේක.

මුළු විශ්වය මරණයෙන් පුරවා ලූ සේක. අහස ස්පර්ශ කළ නමුත්, එතුමාණෝ මිහි මත ගමන් කළ සේක. එහෙත්, සියලු අනතුරින් ඔබේ ජනතාව ගලවාගනු පිණිස මුළු මැවිල්ල ම ඔබේ අණට කීකරු වී සොබා දහමේ නවතාවකින් හැඩගැසුණේ ය.

කඳවුරට ඉහළින් වලාකුළක් මතු විය. ජලය තිබූ ස්ථානයේ වියළි ගොඩ බිම හටගැනිණි. රතු මුහුද බාධා විරහිත මාර්ගයක් විය. බිහිසුණු මුහුදු ජලය පලාවන් තණ බිමක් විය. ඔබේ හස්තයෙන් ආවරණය ලැබ මුළු ජාතිය ම මෙම අරුම පුදුම හාස්කම් දෙස බල බලා මුහුද මැදින් ගමන් කළෝ ය. ජනතාව තණ බිමේ අසුන් මෙන් වූහ. සමිඳුනි, ඔවුන්ගේ විමුක්ති දායකයාණන්ගේ පසස් ගී ගය ගයා ඔවුහු බැටළු පැටවුන් මෙන් පැන පැන ගියහ.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 105: 2-3, 36-37, 42-43

පිළිතුර : සමිඳුන්ගේ පුදුම ක්‍රියා සිහි කරමු.

ගීය :

සමිඳුන්ට ගී ගයන්න. එතුමන්ට පසස් ගී ගයන්න.
එතුමන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.
එතුමන්ගේ ශුද්ධ නාමය ගැන උදම් අනන්න.
සමිඳාණන් සොයන්නන්ගේ සිත් ප්‍රීති ප්‍රමුදිත වේවා!

එතුමාණෝ ඔවුන්ගේ පුරුෂ ශක්තියේ නිධානයෙන් වූ ප්‍රථම ඵලයන් වූ
මිසර දේශයේ සියලු කුළුඳුලාන් මරා දැමූ සේක.
එවිට එතුමාණෝ ඉශ්රායෙල් සෙනඟ තමන්ගේ රන් රිදී පිටතට ගෙනා සේක.
ඔවුන් අතුරෙන් එක ගෝත්‍රයක් වත් නැති වී නොගියේ ය.

එතුමාණෝ සිය මෙහෙකරු ආබ්‍රහම් ද ඔහුට දුන් ශුද්ධ ගිවිසුම ද සිහි කළ සේක.
මෙසේ එතුමාණෝ සිය සෙනඟ පිටත ගෙන යන සේක.
ඔවුහු ප්‍රීති ප්‍රමෝදයෙන් හඬ නගා ගී ගැයූහ.

සුපුවත් ජය නද ජාකොබ් 1: 21

ආලේලූයා! ආලේලූයා!
ඔබට ගැළවීම සාදා දියහැකි,
ඔබ සිත් සතන්හි මුල් බැස ගත් දහම් පණිවුඩය
යටහත් ලෙස පිළිගන්න.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද 2 තෙසලෝනික 2: 14

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ අප කැඳෙව්වේ
අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ
මහිමයට පංගුකාරයන් වන පිණිස ය.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 18: 1-8

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

උන් වහන්සේ තෝරා ගත් අයට දෙවියන් වහන්සේ යුක්තිය ඉටු කරන සේක.

තවද, ඔවුන් අධෛර්ය නොවී සදාතන යාච්ඤාවෙහි යෙදිය යුතු බව දක්වන පිණිස ජේසුස් වහන්සේ ඔවුන්ට මේ උපමාව වදාළ සේක. “එක් නුවරක දෙවියන්ට බිය නැති මිනිසුන්ට ගරු නොකරන විනිශ්චයකාරයෙක් විය. එම නුවර වැන්දඹුවක් ද වූවා ය. ඈ නොයෙක් වර ඔහු වෙත ගොස්, “මාගේ විරුද්ධකාරයා මට කළ අයුක්තියට, යුක්තිය ඉෂ්ට කළ මැනවැ” යි කීවා ය. ඔහු කලක් ඒ ඉල්ලීම නොසලකා හැරියේ ය. පසුව ඔහු තමාට ම මෙසේ කියා ගත්තේ ය. “මා දෙවියන් වහන්සේට ගරු බිය නොපෑවත්, මනුෂ්‍යයන්ට ගරු සරු නොකළත් මේ වැන්දඹුවගේ, කරදරය නිසා ඈ නිතර පැමිණ මා නොවෙහෙසන පිණිස, ඇට යුක්තිය ඉටු කර දෙමි” යි කීයේ ය.

තවද ස්වාමින් වහන්සේ කතා කොට, “මේ අධාර්මික විනිශ්චයකාරයා කියන දේ අසන්න. දෙවියන් වහන්සේත්, දිවා රෑ දෙක්හි තමන් හට අයදින තමන් තෝරාගත් අය ගැන යුක්තිය ඉටු නොකරන සේක් ද? උන්වහන්සේ ඔවුන් ගැන බොහෝ නොඉවසන සේක් ද? උන්වහන්සේ ඔවුන්ට වහාම යුක්තිය ඉටු කරන සේකැයි, මම ඔබට කියමි. එසේ වුවද, මනුෂ්‍ය පුත්‍රයාණන් වඩනා කල මිහිපිට ශ්‍රද්ධාව ඇති අය උන්වහන්සේට සම්බ වනු ඇද්දැ” යි ඇසූ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.